**ශීර්ෂය 294  - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව  2016 වර්ෂය**

---

ශීර්ෂය 294 -  ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 03 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්ව ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150  හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම  ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන්ඇති විය හැකි  සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ  ගිණුම් හා සැසඳුම්  ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා  පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 884.91 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 797.61 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 87.30 ක් හෙවත් සියයට 9.86 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 345.21 | 344.21 | 1.00 | 0.29 |
| මූලධන | 539.70 | 453.40 | 86.30 | 15.99 |
| **එකතුව** | **884.91** | **797.61** | **87.30** | **9.86** |

**2.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 29401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 16.00 | 15.93 | 11.00 | 13.94 | 70.00 | 46.88 |

**2.3** **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0146/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 6.45 ක් විය.

**2.4** **පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 72.30 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0125/000 | 7.23 |
| 6000/0000/00/0016/0074/000 | 63.63 |
| 6000/0000/00/0018/0081/000 | 1.44 |
| එකතුව | 72.30 |

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල විසින් කොන්ත්‍රාත් 36 කට අදාලව සැපයුම් කරුවන්ගෙන් හා කොන්ත්‍රාත් කරුවන්ගෙන් රඳවාගන්නා ලද රු. 34,978,798 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ ඉහත ශේෂය තුළ ඇතුළත් කර තිබුණි.

**2.5** **විගණන නිරීක්ෂණය**

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

### 3.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා මූලධන වැය යටතේ සංවර්ධන වැඩසටහන සඳහා වූ රු.මිලියන 539.70 ප්‍රතිපාදනයෙන් රු.මිලියන 453.40 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 86.30 ක් හෙවත් ඒ සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක් ඉතිරිව තිබුණි.

(ආ) වැය විෂයයන් 3 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසුව ඉතිරිය රු.85,294,303 ක් වූ අතර එය එම විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන අයවැය චක්‍රලේඛයේ (2) වගන්තිය ප්‍රකාරව 2016 අයවැය ඇස්තමේන්තු වල වැය විෂය සංකේතාංක 1202 - ඉන්ධන වලින් සියයට 15 ක අනිවාර්ය ඉතිරිකිරීමක් සිදුකල යුතු වුවද දෙපාර්තමේන්තුව අදාල වැය විෂය සංකේතාංක යටතේ සියයට 2 ක ඉතිරියක් පමණක් සිදුකර තිබුණි.

### 3.3 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.18,805,522 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 29401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 3,247,427 ක් වූ අතර, වර්ෂ 01 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක් ගත වී

තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ  අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුනි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු. 1,504,210 ක් වූ අතර ඉන් රු. 407,524 ක ශේෂයක් වර්ෂ 10 ඉක්මවා තිබූ අතර වර්ෂ 05 ඉක්මවූ ශේෂය රු. 95,955 ක් විය. සමාලෝචිත වර්ෂය තුලදී ද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය අත්තිකාරම් ශේෂය රු. 1,097,659 ක් වූ අතර ඉන් වර්ෂ 10 ඉක්ම වූ රු. 250,410 ක ණය ශේෂයක් හා වර්ෂ 05 ඉක්ම වූ රු.402,714 ක් විය. එම ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂය අවසාන වන විට සේවය හැරගොස් තිබූ නිලධාරින් 10 දෙනෙකුට අදාලව රු. 367,550 ක ශේෂයක් පැවති අතර ඉන් වර්ෂ 10 ඉක්මවූ රු. 123,095 ක ශේෂයක් හා වර්ෂ 05 ක් ඉක්ම වූ රු. 4,350 ක ශේෂය ද වර්ෂය තුලදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති අතර ඒවායේ වටිනාකම් හා නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති කාලය විගණනයට ඉදිරිපත් නොවුණි.

| | **වත්කම් වර්ගය** | **ඒකක ගණන** |
|---|---|---|
| (i) | කාර්යාල උපකරණ | 58 |
| (ii) | ලී බඩු හා උපකරණ | 33 |
| (iii) | පරිගණක හා උපාංග | 15 |
| (iv) | වෙනත් වත්කම් | 310 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

------------------------------------------

2015 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ඇතැම් අංශවල අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 771 පරිදි කටයුතු කර නොතිබුණි**.**

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

-----------------------------

සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 94(1) විධිවිධානයට පටහැනිව වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා  එකතුව රු.මිලියන 2.74 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XIX පරිච්ඡේදයේ 8.2 වගන්තිය | නිවාසයේ නඩත්තුව පිළිබඳ වගකීම පැවරී ඇති නිලධාරීන් රජයේ උප ලේඛනගත හෝ පොදු සේවා නිවාස සඳහා ඉන්වෙන්ට්‍රි ගොනු වෙන් වෙන් වශයෙන් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මුදල් රෙගුලාසි 371 (2) (ආ) | නිලධාරියා විසින් අදාල කාර්යය නිමකල විගසම අග්‍රිමය පියවිය යුතු වුවද නිලධාරීන් 07 දෙනෙකු වෙත ලබා දුන් රු.367,800 ක තත්කාර්යය අතුරු අග්‍රිමය පියවීම සඳහා මාස 01 සිට 11 දක්වා කාල පරාසයක් ගතකර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 454 (1) | ආණ්ඩුවේ ගබඩා බඩුවල සෑම ද්‍රව්‍යයක්ම භාරගැනීම හා නිකුත් කිරීම බඩුලේඛන පොතෙහි සටහන් කල යුතු වුවත් ඇතැම් භාණ්ඩ බඩු වට්ටෝරු පොතට ඇතුලත් කර නොතිබුණු බව නියැදි පරීක්ෂණයෙන් අනාවරණය විය. |
| (iii) මුදල් රෙගුලාසි 751 | ප්‍රධාන ආපන ශාලාව සතු කිසිදු භාණ්ඩයක් බඩු වට්ටෝරු පොතට ඇතුලත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 754 | සත්ව අංශයේ පෙර වර්ෂවලට අදාල භාණ්ඩ සම්බන්ධ කිසිදු තොරතුරක් නව භාණ්ඩ වට්ටෝරු පොතෙහි සඳහන් වී නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 757 (ආ) | ආදර්ශ ද්‍රව්‍යය එකතු කිරීමේ අංශය විසින් භාණ්ඩාගාර 66 ආකෘති පත්‍රය සම්පූර්ණකර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත භාරදී නොතිබුණි. |

**3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු.මිලියන | | |
| පින්නවල සත්වෝද්‍යානයේ උරග උයන | 51.20 | 2016 අප්‍රේල් 01 | ඉදිරිපත් නොකෙරුණි. |
| පින්නවල සත්වෝද්‍යානයේ ජලජ පක්ෂි දූපත | 5.0 | 2016 මැයි 01 | ඉදිරිපත් නොකෙරුණි. |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

---

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2016 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු.මිලියන | | රු.මිලියන | |
| පින්නවල සත්වෝද්‍යානයේ සමනළ උයන හා සහ ගේබියන් බැම්ම | 8.00 | 2016.09.02 | 1.99 | අපේක්ෂිත මට්ටමින් ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම. |
| පින්නවල සත්ව උද්‍යානයේ වැසිකිළි පද්ධතිය | 42.14 | 2016.08.23 | 8.43 | කොන්ත්‍රාත්කරු නියමිත කාලයට වැඩ අවසන් කිරීමට අපොහොසත් වීම. |

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---

හම්බන්තොට රිදියගම සෆාරි උද්‍යානයේ පහත සඳහන් ව්‍යාපෘතිය ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළදිනය | නිමකළ යුතු දිනය | නිමකල දිනය | 2016 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| ------------- | --------------- | ------------ | | ----------------- | ---------------- | ------------------- |
| | රු.මිලියන | | ---------- | | රු.මිලියන | |
| වලස් කලාපයට සහ බෙංගාල කොටි කලාපයට මායිම්ව ඇති 16"උස චේන්ලින්ක් වැට ඉදිකිරීම | 27.14 | 2016 නොවැම්බර් 15 | 2016 දෙසැම්බර් 06 | 2017 ජූලි 30 දින වන විටත් ව්‍යාපෘතිය අවසන්කර නොතිබුණි. | 4.17 | ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතා |
| අලිඅරණ සහිත ආසියානු කලාපයේ බොරළු මාර්ගය ඉදිකිරීම | 79.60 | 2016 නොවැම්බර් 30 | 2017 මාර්තු 16 | 2017 ජූලි 30 දින වන විටත් ව්‍යාපෘතිය අවසන්කර නොතිබුණි. | 76.71 | ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතා |

**3.8 කාර්යසාධනය**

----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) **දෙහිවල සත්වෝද්‍යානයේ ප්‍රධාන සංවර්ධන කාර්යයන්**

-----------------------------------------------------------------

(i) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 22 ක ඇස්තමේන්තුවකට සමාලෝචිත වර්ෂය තුලදී නිමකිරීමට සැලසුම් කර තිබුණු මාර්ග අංක 08 ආශ්‍රිත කලාපය සංවර්ධනය කිරීමට අදාල ඉදිකිරීම් කටයුතු වලින් සියයට 18 ක් පමණක් වර්ෂය අවසාන වනවිට නිමකර තිබුණි..

(ii) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව 2016 දෙසැම්බර් 31 දිනට නිමකිරීමට සැලසුම් කර තිබුණු චිම්පන්සි අරණ අදියර 01 හා මායිම් තාප්පය අලුත්වැඩියාව අදියර 02 යන ඉදිකිරීම් වල ප්‍රගතිය පිළිවෙලින් සියයට 25 සිට සියයට 15 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) වාර්ෂික කාර්ය සාධන වාර්තාව අනුව දෙහිවල සත්වෝද්‍යානයේ ප්‍රධාන සැලසුමෙහි සමස්ත භෞතික ප්‍රගතිය සියයට 50 ක් පමණක් විය.

(ආ) **පින්නවල අලි අනාථාගාරයේ ප්‍රධාන සංවර්ධන කාර්යයන්**

සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 08ක් වූ සේවා සපයන මාර්ග අලුත්වැඩියාව සඳහා සැලසුම් සකස් කර තිබුණි. ඒ අනුව 2016 අගෝස්තු 30 දින වනවිට නිමකලයුතු වූ සේවා සපයන මාර්ග අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය 2016 දෙසැම්බර් 31 දින වනවිටත් සම්පූර්ණ වී නොතිබුණු අතර එදිනට ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 60 ක් පමණක් විය.

(ඇ) **හම්බන්තොට රිදියගම සෆාරි උද්‍යානයේ ප්‍රධාන සංවර්ධන කාර්යයන්**

(i) අලි අරණ සහිත ආසියානු කලාපයේ ජල සැපයුම හා කලාපය වටාවූ 8’ උස චේන්ලින්ක් වැට යන ඉදිකිරීම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පිළිවෙලින් සියයට 20 ක් හා සියයට 35 ක් පමණක් නිමකර තිබුණි.

(ii) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 12 කට නිමකිරීමට ඇස්තමේන්තු කර තිබුණු මාණ්ඩලික නිලධාරීන් සඳහා නිලනිවාස ඉදිකිරීමට අදාලව සියයට 20 ක ඉදිකිරීම් පමණක් වර්ෂය තුළ සිදුකර තිබුණි. තවද මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් ඉදිකිරීමේ කටයුතු ප්‍රදානය කරන ලද ජාතික ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමග එකග වී තිබුණු කොන්ත්‍රාත් මුදල රු. 58,993,620 ක් (එකතු කළ අගය මත බදු සහ අසම්භාව්‍යතා රහිත) විය.

(iii) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වී නොතිබුණු අලිඅරණ සහිත ආසියානු කලාපයේ බොරළු මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම වෙනුවෙන් රු. 70,602,876 ක (එකතු කළ අගය මත බදු සහ අසම්භාව්‍යතා රහිත) මුදලකට ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ප්‍රදානය කර තිබුණි.

(iv) 2016 දෙසැම්බර් 06 දින වනවිට වැඩ නිමකළ යුතු බෙංගාල කොටි කලාපයේ මායිම් වැටවල් 04 ක් ඉදිකිරීමට අදාලව පිළිවෙලින් සියයට 75ක්, සියයට 50ක්, සියයට 60ක් හා සියයට 65 ක ප්‍රමාණයක් පමණක් 2016 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ රු.මිලියන 88.13 ක ඇස්තමේන්තුවක් මඟින් නිමකිරීමට සැළසුම් කරන ලද ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති 13 ක කටයුතු ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාදයන් හා කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතා හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කර නොතිබුණි.

## 3.9 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණයන් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**-----------------------------------------------------------------------**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.4 (ඇ) මාර්ගෝපදේශයට පටහැනිව සත්වෝද්‍යානයේ කිඹුල් අරණක් ඉදිකිරීමට අදාලව ඉදිකිරීම් කටයුතු සහ සැලසුම් කිරීමේ හා උපදේශක සේවා සැපයීම සඳහා කොන්ත්‍රාත්තු එකම ආයතනයක් වෙත ප්‍රදානය කර ඒ වෙනුවෙන් රු. 68,971,870 ක් වැය කර තිබුණි.

**3.10 කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) 2008 වර්ෂය ආරම්භයේදී පින්නවල වාගොල්ල නව සත්වෝද්‍යානය සඳහා පවරාගැනීමට හඳුනාගෙන තිබූ ඉඩම් අක්කර 11 රූඩ් 02 පර්චස් 02 ක ප්‍රමාණය පවරාගැනීම සම්බන්ධ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටද නිමකර නොතිබුණි.

(ii) 2008 වර්ෂයේදී පින්නවල සත්වෝද්‍යානයේ ii අදියර යටතේ පවරා ගැනීම සඳහා හඳුනාගෙන තිබුණු ගඟෙන් එගොඩ ප්‍රදේශයේ පිහිටි ඉඩම් අක්කර 79 රූඩ් 01 පර්චස් 27 ක් වූ ඉඩම් කැබලි 08 ක පවරාගැනීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දක්වාත් අවසන් කර නොතිබුණි. එයින් අක්කර 34 රූඩ් 01 පර්චස් 07 ක් වූ බිම් කැබලි 03 ක් සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 4 වන වගන්තිය යටතේ පැවත් වූ විරෝධතා පරීක්ෂණවල නිර්දේශ 2016 වර්ෂය අවසාන වන විටද ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර නොතිබුණි. අත්පත් කර ගැනීමේ කටයුතු දීර්ඝ කාලයක් අඩපණව පැවති තුඩුවේ හේන/ කුඹුකෙවත්ත, මහලන්ද පාලු වත්ත ,මහලන්ද වත්ත හා මැද බිත්තර පැල/කුඩාමඩත යන ඉඩම් වල පිහිටි කැබලි 05 ක අත්පත් කර ගැනීමේ කටයුතු වලද ප්‍රමාණවත් ප්‍රගතියක් 2016 දෙසැම්බර් 31 දින වනවිට නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iii) 2008 වර්ෂයේදී පින්නවල අලි අනාථාගාරය පිහිටි භූමිය පුළුල් කිරීමේ පදනම යටතේ අත්පත් කර ගතයුතු ඉඩම් ලෙස හඳුනාගෙන තිබුණු ඉඩම් කැබලි 12 ක අක්කර 07 රූඩ් 02 පර්චස් 15 ක ප්‍රමාණයකින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණේ අක්කර 01 රූඩ් 03 පර්චස් 08 ක් වූ ඉඩම් කැබලි 02 ක් පමණක් විය. තවදුරටත් අක්කර 05 රූඩ් 03 පර්චස් 07 ක පිහිටි ඉඩම් කැබලි 10 ක් අත්පත් කර ගත යුතුව තිබුණි. මින් ඉඩම් කැබලි 03 කට අදාලව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 04 වන වගන්තිය යටතේ වූ නිර්දේශ ඉඩම් අමාත්‍යාංශය වෙත 2016 දෙසැම්බර් 31 දින වනවිට ඉදිරිපත් කර නොතිබුණි. එසේම වන්දි ගෙවීමට නියමිතව තිබුණු රූඩ් 02 පර්චස් 03 ක ප්‍රමාණයේ ඉඩම් කැබලි 02 ක් සඳහා ද වන්දි ගෙවා නොතිබුණි. පවරාගත යුතු අනෙක් බිම් කැබලි අත්පත් කරගැනීම සම්බන්ධයෙන් ද සැලකිය යුතු ප්‍රගතියක් 2016 දෙසැම්බර් 31 දිනට ලඟා කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**--------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 22 | 7 |
| (ii) | තෘතියික මට්ටම | 2 | 1 | 1 |
| (iii) | ද්විතියික මට්ටම | 185 | 133 | 52 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 646 | 474 | 172 |
| | එකතුව | 862 | 630 | 232 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 232 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණු අතර එම පුරප්පාඩුවලින් වැඩි ප්‍රමාණයක් සත්වයන් රැකබලා ගැනීම, සත්වයන්ගේ සෞඛ්‍යය, පෝෂණය සහ සත්ව පාලනය සම්බන්ධ තනතුරුවලට සෘජුවම සම්බන්ධවන පුරප්පාඩු බව නිරීක්ෂණය විය.